# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## **2006 අංක 45 දරන ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත**

---

[**සහතිකය සටහන් කළේ 2006 නොවැම්බර් මස 17 වන දින**]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 නොවැම්බර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. 4.25 යි. **තැපැල් ගාස්තුව :** රු. **5.00** යි.

## 2006 අංක 45 දරන ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 නොවැම්බර් මස 17 වන දින]

එල්. ඩී. ඕ.— අයි. එන්. සී. 6/2005

### 1992 අංක 6 දරන ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

පවතින සංස්ථාවට, වඩා කාර්යක්ෂම ලෙසත් ප්‍රජාතන්ත්‍රවාදී ලෙසත් එහි ක්‍රියාකාරකම්වල යෙදීමට ඉඩකඩ සැලැස්වීම සඳහා ද සංස්ථාව සහ එහි පාලක සභාවට සක්‍රීය ක්‍රියාකාරකම් වඩා කාර්යක්ෂම ලෙසත් පහසු ලෙසත් කරගෙන යාමට ඉඩකඩ සලසාදීම සඳහා ද, ඊට අදාළ ව්‍යවස්ථාවෙහි වගන්ති වෙනස් කිරීම සඳහා සංස්ථාවට ඉඩකඩ සලසා දීම පිණිස ද, ඒ ඒ කාලවල දී ඇතිවන වෙනස්වීම්වලට සරිලන සේ පහසුකම් ඇති කරලීම සඳහා අවශ්‍ය ව ඇති හෙයින් ද:

ඉහත සඳහන් අවශ්‍යතා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ පනතට අවශ්‍ය සංශෝධන කරන ලෙස සංස්ථාව විසින් ඉල්ලා ඇති හෙයින් සහ එසේ සංශෝධනය කිරීම ප්‍රඥාගෝචර වී ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

**1**. මේ පනත 2006 අංක 45 දරන ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය (සංස්ථාගත කිරීමේ) පනතේ 4(1) දරන වගන්තිය සංශෝධනය කිරීම.

**2**. ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය (සංස්ථාගත කිරීමේ) පනතේ 4(1) දරන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

> "(1) සංස්ථාවේ ක්‍රියාකාරකම් තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ නීති හා රෙගුලාසිවලට යටත්ව සංස්ථාව විසින් තෝරා පත් කරන ලද නිලධාරි මණ්ඩලය හා එසේ ම පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් ඇතුළත් මණ්ඩලයක් විසින් එහි පරිපාලනය කළ යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.